

පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

“ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ තාවකාලිකව අත්හැර දමන ලද ව්‍යාපෘති නැවත බල ගැන්වීම හා තක්සේරු වාර්තා ලබා ගැනීම ක්‍රමවත් කිරීම හා ඇති වන ප්‍රමාදයන් වලක්වා ගැනීම’’ සම්බන්ධයෙන් වන වාර්තාව

2024 අගෝස්තු මස 07 වැනි බදාදා

**පරිසරය ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයින්**

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා, පා.ම. (සභාපති)
ගරු සී.බී.රත්නායක මහතා, පා.ම.
ගරු ජයන්ත සමරවීර මහතා, පා.ම.
ගරු ජයන්ත කැටගොඩ මහතා, පා.ම.
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා, පා.ම.
ගරු වරුණ ලියනගේ මහතා, පා.ම.
ගරු අකිල එල්ලාවල මහතා, පා.ම.
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා, පා.ම.
ගරු අලි සබ්රි රහීම් මහතා, පා.ම.
ගරු වෛද්‍ය තිලක් රාජපක්ෂ මහතා, පා.ම.
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා, පා.ම.
ගරු වීරසේන ගමගේ මහතා, පා.ම.

**කාරක සභාව සතු බලතල**
පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවලින් එකක් වන මෙම කමිටුවට ඇති බලතල සහ ක්‍රියාකාරීත්වය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 යටතේ දක්වා ඇති අතර, එම තොරතුරු www.parliament.lk වෙබ් අඩවියෙහි ඇතුළත්ය.

**ප්‍රකාශන**
ආංශික අධීක්ෂණ කාරක සභාවන් විසින් ප්‍රකාශයට පත්කරනු ලබන වාර්තා සහ සාක්ෂි පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා කාර්යාංශයෙන්(කාරක සභා අංක II) හෝ www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.

**කාරක සභා කාර්ය මණ්ඩලය**
කුෂානි රෝහණදීර මහත්මිය - පාර්ලිමේන්තුවේ මහ ලේකම්
චමින්ද කුලරත්න මහතා - කාර්යය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්
හංස අබේරත්න මහතා - සහකාර මහ ලේකම්
එම්. ජයලත් පෙරේරා මහතා - අධ්‍යක්ෂ, ව්‍යවස්ථාදායක සේවා
චූලා හේරත් මහත්මිය - සහකාර අධ්‍යක්ෂ පරිපාලන
තුසිතා ද සිල්වා මහත්මිය - ප්‍රධාන නිලධාරි
චමිලා රූපසිංහ මහත්මිය - නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි

**යොමුව සහ විමසීම්**
මෙම වාර්තාව පිළිබඳ සියලුම ලිපිලේඛන සහ විමසීම් සඳහා, ලේකම්, පරිසරය ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය සඳහා වන ආංශික අධීක්ෂණ කාරක සභාව, කාරක සභා කාර්යාංශය II, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත යොමු කළ යුතුයි. පොදු විමසීම් සඳහා දුරකථන අංක 0112777420/0112777405 අමතන්න.

**පරිසරය ස්වාභාවික සම්පත් හා තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

" නාගරික සංවර්ධන අධිකාරිය යටතේ තාවකාලිකව අත්හැර දමන ලද ව්‍යාපෘති නැවත බල ගැන්වීම හා තක්සේරු වාර්තා ලබා ගැනීම ක්‍රමවත් වීම හා ඇති වන ප්‍රමාදයන් වලක්වා ගැනීම'' සම්බන්ධයෙන් පරිසරය ස්වාභාවික සම්පත් හා තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලන ලද අතර ඒ පිළිබඳ කමිටුවේ නිර්දේශ පාර්ලිමේන්තුවට ලබාදීම සඳහා ඉදිරිපත් කරන මෙම වාර්තාව කමිටුවේ සාමාජිකයින් වන අපි අනුමත කරමු.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා, පා.ම. (සභාපති) ..............................

ගරු සී.බී.රත්නායක මහතා, පා.ම. ..............................

ගරු ජයන්ත සමරවීර මහතා, පා.ම. ..............................

ගරු ජයන්ත කැටගොඩ මහතා, පා.ම. ..............................

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා, පා.ම. ..............................

ගරු වරුණ ලියනගේ මහතා, පා.ම. ..............................

ගරු අකිල එල්ලාවල මහතා, පා.ම. ..............................

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා, පා.ම. ..............................

ගරු අලි සබ්රි රහීම් මහතා, පා.ම. ..............................

ගරු වෛද්‍ය තිලක් රාජපක්ෂ මහතා, පා.ම. ..............................

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා, පා.ම. ..............................

..................................................

චූලා හේරත් මිය, ආංශික අධීක්ෂණ කාරක සභාවේ ලේකම්

පටුන

1. හැඳින්වීම ........................................ 5

2. අතහැර දැමූ ව්‍යාපෘති සලකා බැලීම ........................................ 7

2.1 මූල්‍යමය හේතූන් මත අතහැර දැමූ ව්‍යාපෘති ........................................ 7

2.2 මූල්‍යමය නොවන හේතූන් මත අතහැර දැමූ ව්‍යාපෘති ........................................ 9

3. තක්සේරු දෙපාර්තමේන්තුව හා නාගරික සංවර්ධන අධිකාරිය අතර තක්සේරු වාර්තා ලබා ගැනීමේදී අපේක්ෂිත වටිනාකම හා තක්සේරු කිරීමට ගතවන කාලය අවම කිරීම හා අපේක්ෂිත අයුරින් නිවැරදි වටිනාකම ලබා ගැනීමට ගත හැකි පියවර ........................................ 13

4. නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රතිපත්තිය ........................................ 16

5. කාරක සභාවේ නිර්දේශ ........................................ 17

6. කාරක සභාව වෙත කැඳවන ලද ආයතන සහ නිලධාරීන් ........................................ 18

## 1. හැඳින්වීම

නාගරික සංවර්ධන අධිකාරිය විසින් පසුගිය වසර 10ක පමණ කාලය තුළ විවිධ වැය ශීර්ෂ යටතේ ලද භාණ්ඩාගාර මුදල් සහ නාගරික සංවර්ධන අධිකාරියේ ස්වකීය මුදල් (own funds) භාවිතා කර දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද, එහෙත් විවිධ හේතූන් මත වැඩ අවසන් නොකර නවතා දමා ඇති හෝ වැඩ අවසන් කර එහෙත් නිසි පරිදි අදාළ පළාත් පාලන ආයතන වෙත පවරා දීමට නොහැකි වූ ව්‍යාපෘති පිළිබඳ සහ එමඟින් ව්‍යාපෘතීන් ආරම්භ කිරීමේදී සහ පවත්වාගෙන යාමේදී අනුගමනය කරන ක්‍රමෝපායන්හි හෝ පවතින නීතිරීතිවල වෙනසක් සිදුකිරීම සම්බන්ධයෙන් පරිසරය, ස්වාභාවික සම්පත් සහ තිරසර සංවර්ධනය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව සිය අවධානය යොමු කරන ලදී.

මේ යටතේ ව්‍යාපෘතීන් 23ක් දැනට අතරමඟ නවත්වා ඇති බවත්, ඒ සඳහා රු. මිලියන 14,949/= ක මුදලක් ඇස්තමේන්තුගත කර ඇති බවත්, නාගරික සංවර්ධන අධිකාරිය විසින් රු. මිලියන 3,842.24ක් වැය කර තිබුණද, තවදුරටත් ගෙවීම සඳහා රුපියල් මිලියන 227.15ක හිඟ බිල්පත් පවතින බවත්, රුපියල් මිලියන 9,953.84ක මුදලක් ව්‍යාපෘතිවල වැඩ නිම කිරීම සඳහා තවදුරටත් අවශ්‍යව ඇති බවත් අනාවරණය විය. මෙම ව්‍යාපෘති අතර මුදල් නොමැතිවීම නිසා නැවතී ඇති ව්‍යාපෘතීන් මෙන්ම විවිධ ආයතන අතර පවතින නිරවුල් කරගත යුතු ආයතනික ප්‍රශ්න හේතුවෙන් නැවතී ඇති ව්‍යාපෘතීන් ද පැවතුණි. "සියක් නගර" අයවැය ප්‍රතිපාදන යටතේ ආරම්භ කර දැනට අත්හැර දමා ඇති ව්‍යාපෘති 14ක් කෙරෙහි ද කාරක සභාවේ අවධානය යොමු විය. මේ යටතේ ගම්පහ, පානදුර, අවිස්සාවේල්ල, හෝද්ලුවාගොඩ, බොරලැස්ගමුව, අම්පාර යන නගර ආශ්‍රිත පොදු වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක විය.

මූල්‍යමය නොවන හේතූන්, එනම් විවිධ ආයතන අතර පවතින නිරවුල් කරගත යුතු ආයතනික ප්‍රශ්න හේතුවෙන් නැවතී ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළුව ලංකා විදුලිබල මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව ද කාරක සභාව හමුවට කැඳවන ලදී. මේ යටතේ නැවතී ඇති ව්‍යාපෘති 11ක් අතුරින් කොට්ටාව සිට මාහේනවත්ත දක්වා නව පිවිසුම් මාර්ගය ඉදිකිරීම, අලව්ව නගර සංවර්ධනය (මාර්ග පුළුල් කිරීම), ගම්පහ අධිවේගී මාර්ගයෙන් යක්කල දෙසට පිවිසුම ඉදිකිරීම, ඉමදුව නගරය පුළුල් කිරීම, බේරුවානවත්ත, ඇහැළියගොඩ අඩු ආදායම්ලාභී නිවාස ඉදිකිරීම, හැටන් දුම්රියපොළ සංවර්ධනය, ගම්පහ මාකවිට නෙළුම්විල යෝජිත ශරීර සුවතා මංතීරු ව්‍යාපෘතිය, ගම්පහ සියත උද්‍යාන ව්‍යාපෘතිය සහ වැලිකඩ බන්ධනාගාරය ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කාරක සභාව ප්‍රධාන වශයෙන් සලකා බලන ලදී. මූල්‍යමය නොවන හේතු මත නැවතී ඇති ව්‍යාපෘති සඳහා දැනටමත් රු. මිලියන 2,531ක රජයේ මුදල් වියදම් කර තිබුණද, මෙම ව්‍යාපෘතීන් අතරමඟ නැවතී තිබීම හේතුවෙන් මුදල් ද වියදම් කර, ජනතාවට සිය පදිංචි ස්ථාන ද අහිමි වී, අපේක්ෂිත ප්‍රතිලාභ ද නොමැතිව සමාජයට ගැටළුවක් වී ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය.

මුදල් නොමැති වීම නිසා දැනට ඉදිකිරීමේ කටයුතු අතරමඟ නැවතී ඇති ව්‍යාපෘතීන් 23 කෙරෙහි අවධානය යොමු කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් යොදාගෙන ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් 04ක් ද මහා

භාණ්ඩාගාරයේ මුදල් මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් 19ක් ද සලකා බලන ලදී. 2022 මාර්තු මාසයේදී මුදල් අමාත්‍යාංශය නිකුත් කරන ලද චක්‍රලේඛය අනුව මුදල් ලබා නොදීම හේතුවෙන් බොහෝ ව්‍යාපෘතිවල වැඩ කටයුතු නැවතී ඇත. නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය සඳහා 2023 වර්ෂයට වෙන් කර ඇති මිලියන 4,500ක මුදල තුළ මහජනතාවට සැලසෙන සේවය අනුව සලකා බලා ප්‍රමුඛත්වයක් ලබාදිය යුතු ව්‍යාපෘතීන් 13ක් හඳුනාගෙන ඇති අතර ඒවායේ කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි. මේ යටතේ විවිධ ප්‍රදේශවල පොදු වෙළඳපොළ ඉදිකිරීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට කාරක සභාවේ අවධානය යොමු විය. ඒ සඳහා අදාළ ව්‍යාපෘතියේ ඉඩම් හෝ ගොඩනැඟිලි බදු දීමෙන් ආදායම් උපයාගෙන එම මුදල් ව්‍යාපෘතිවල කටයුතු ඉදිරියට කරගෙන යාමට කාරක සභාව උපදෙස් දෙන ලදී. මෙහිදී කාරක සභාවේ අදහස වූයේ මෙම ව්‍යාපෘතිවල ඉතිරි වැඩ ඉතා අඩු වියදමකින් නිමකර එම ගොඩනැඟිලි බදු දීම තුළින් උපයා ගන්නා ආදායමින් අදාළ ප්‍රාදේශීය සභා හෝ නගර සභාවලට ව්‍යාපෘතිවල ඉදිරි වැඩ කටයුතු නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති සැලැස්ම ප්‍රතිශෝධනය කළ යුතු බවය. එසේම රාජ්‍ය සහ පෞද්ගලික යන දෙපක්ෂයේ ම සහයෝගයෙන් ව්‍යාපෘතිවල කටයුතු නිම කිරීමට ඇති හැකියාව සොයා බලන ලෙස ද කාරක සභාව උපදෙස් දෙන ලදී.

ව්‍යාපෘති අතරමඟ නැවතීම සඳහා ව්‍යාපෘතියට සම්බන්ධවන ආයතන අතර මනා සහයෝගයක් හෝ ඒකඟතාවයක් නොමැතිවීම ප්‍රධානම හේතුව බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී. එසේම පවතින සීමිත සම්පත් යටතේ ව්‍යාපෘති ආරම්භ කිරීමේදී සමාජීය, ආර්ථික, පාරිසරික බලපෑම් සම්බන්ධයෙන් පූර්ව විශ්ලේෂණයක් සිදු කර වඩාත් වාසිදායක වඩාත්ම වැදගත්වන සහ ඵලදායී ක්‍රමවේදය අනුගමනය කළ යුතු බව කාරක සභාවේ නිර්දේශය විය.

ඇහැලියගොඩ නගරයේ තදබදය අවම කිරීමට දුම්රිය මාර්ගයක් /මහාමාර්ගයක් තැනීමේදී වඩාත් අවශ්‍යව ඇති ක්‍රමවේදය තෝරා ගැනීම සඳහා ප්‍රදේශයේ දේශපාලන නායකයින් සහ අදාළ ආයතන ඒකාබද්ධව කමිටුව සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී දුම්රිය මාර්ගය සහ මහා මාර්ගය යන දෙකම එකිනෙකට සමාන්තරව සෑදීමට ඇති හැකියාව ද කාරක සභාව හමුවේ සාකච්ඡාවට බඳුන් විය.

ආංශික අධීක්ෂණ කාරක සභාව 2023 මැයි මස 25, ජුනි මස 20, අගෝස්තු මස 8, සැප්තැම්බර් මස 7, දෙසැම්බර් මස 6 සහ 2024 ජුනි මස 07 යන දිනවලදී රැස් වී නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කර අත්හැර දමන ලද ඉහත සඳහන් ව්‍යාපෘතීන් පිළිබඳව සාකච්ඡා කරන ලදී. ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් මීට අදාළව කටයුතු කරන ප්‍රධානම රාජ්‍ය ආයතනය වන නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය සලකා බලා ඵලදායී ලෙස නැවත ව්‍යාපෘති ආරම්භ කර වැඩ අවසන් කළ හැකි ආකාරය සම්බන්ධව විවිධ නිර්දේශයෙන් ලබා දීමෙන් පසුව ඒ මත පදනම්ව කාරක සභාවේ නිරීක්ෂණ, යෝජනා සහ අදහස් පාර්ලිමේන්තුවට ලබාදී රජයේ වගකිව යුතු අංශවල අවධානය තවදුරටත් මේ සඳහා යොමු කිරීම සඳහා ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් මෙම වාර්තාව සකස් කරන ලදී.

## 2. අතහැර දැමූ ව්‍යාපෘති සලකා බැලීම

2.1 මූල්‍යමය හේතූන් මත අතහැර දැමූ ව්‍යාපෘති

ප්‍රධාන වශයෙන් මූල්‍යමය හේතූන් මත අතහැර දැමූ ව්‍යාපෘති 14ක් මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වීමට නියමිත පවතින අතරම ටෙන්ඩර් කැඳවීමට නියමිත ව්‍යාපෘති 6ක් ද ඇත. එහි වැඩිදුර විස්තර පහත වගුව මඟින් පෙන්වාදිය හැකිය.

| | ව්‍යාපෘතියේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තාවකාලික ඇස්තමේන්තු ගත කළ අගය (සංශෝධිත) රු. මිලියන | තාවකාලික ඇස්තමේන්තු ගත කළ අගය (සංශෝධිත) රු. මිලියන | වියදම රු. මිලියන | ගෙවීමට ඇති බිල්පත් වටිනාකම රු. මිලියන | අරමුදල් අවශ්‍යතා රු. මිලියන | 2023.12.31 දිනට තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | රථගාල සංවර්ධනය ව්‍යාපෘතිය | කොළඹ | 1565.70 | 1245.00 | 657.00 | 15.00 | 588.00 | තාවකාලිකව නවතා දමා ඇත |
| 2 | නාරාහේන්පිට යෝජිත බහු මහල් රථගාල ඉදිකිරීම | නාරාහෙන්පිට | 998.00 | 1178.00 | 395.00 | 180.00 | 603.00 | තාවකාලිකව නවතා දමා ඇත |
| 3 | අම්පාර පොළ ඉදිකිරීම | අම්පාර | 210.00 | 160.00 | 34.00 | | 200.00 | තාවකාලිකව නවතා දමා ඇත |
| 4 | වෙරළ උද්‍යානය ඉදිකිරීම (අදියර II) | නින්දවූර් | 35.00 | 22.00 | 9.00 | | 30.00 | ක්‍රියාත්මකව පවතී |
| 5 | වලපනේ සතිපොළ සහ බහුකාර්ය ගොඩනැගිල්ල | වලපනේ | 118.80 | 228.00 | 48.00 | | 100.00 | තාවකාලිකව නවතා දමා ඇත |
| 6 | තලාතුඔය රථගාල සංවර්ධනය ව්‍යාපෘතිය (අදියර II) | මහනුවර | 9.18 | 33.62 | 3.62 | | 30.00 | තාවකාලිකව නවතා දමා ඇත |
| 7 | දවුලගල මහජන පොළ සංවර්ධනය | මහනුවර | 10.54 | 31.75 | 1.75 | | 30.00 | තාවකාලිකව නවතා දමා ඇත |
| 8 | හබරණ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය සහ භූමි අලංකරණය ("සියක් නගර" ව්‍යාපෘතිය යටතේ) | හබරණ | 18.51 | 40.08 | 3.83 | | 36.25 | තාවකාලිකව නවතා දමා ඇත |
| 9 | කැකිරාවේ මලවවැව භූමි අලංකරණය | කැකිරාව | 18.44 | 33.23 | 8.28 | | 24.95 | තාවකාලිකව නවතා දමා ඇත |

| | ව්‍යාපෘතියේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තාවකාලික ඇස්තමේන්තු ගත කළ අගය (සංශෝධිත) රු. මිලියන | තාවකාලික ඇස්තමේන්තු ගත කළ අගය (සංශෝධිත) රු. මිලියන | වියදම රු. මිලියන | ගෙවීමට ඇති බිල්පත් වටිනාකම රු. මිලියන | අරමුදල් අවශ්‍යතා රු. මිලියන | **2023.12.31** දිනට තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|
| 10 | මුලතිව් බස් නැවතුම ඉදිකිරීම | මුලතිව් | 107.00 | 170.00 | 21.00 | | | ක්‍රියාත්මකව පවතී |
| 11 | මාලිබොඩ නිවාස ඒකක 54ක් ඉදිකිරීම | කෑගල්ල | 148.63 | 378.18 | 70.14 | 14.96 | 293.08 | තාවකාලිකව නවතා දමා ඇත |
| 12 | යාපනය නගර ශාලාව ඉදිකිරීම | යාපනය | 2350.00 | 3769.70 | 1233.34 | | 600.00 | ව්‍යාපෘතිය ක්‍රියාත්මකව පවතී (සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා මිලියන 2536.36ක් අවශ්‍යව ඇත. අදියර i/ ලෙස හඳුනාගෙන ඇති ගොඩනැගිල්ලේ කොටසක් නිම කිරීම සඳහා රු. මිලියන 600.00) |
| 13 | කොළඹගේ මාවතේ නිවාස ඒකක 615ක් ඉදිකිරීම (ශේෂ කටයුතු නැවත ප්‍රදානය කිරීම) | කිරුලපන | 6921.41 | | 1254.73 | | 5666.68 | තාවකාලිකව නවතා දමා ඇත |
| 14 | ටොරින්ටන් හි නිවාස ඒකක 115ක් ඉදිකිරීම | කිරුලපන | 1664.03 | 0.00 | 96.65 | | 1567.38 | තාවකාලිකව නවතා දමා ඇත |
| 15 | මිනුවන්ගොඩ මහජන වෙළඳපොල | මිනුවන්ගොඩ | 50.00 | | | | 30.00 | ක්‍රියාත්මකව පවතී |
| 16 | පේරලන්ද තෙත්බිම් ප්‍රදේශයේ විනෝදාත්මක සංවර්ධන ව්‍යාපෘතිය (අදියර III) | රාගම | 154.50 | | | | 154.50 | තාවකාලිකව නවතා දමා ඇත |
| 17 | බොරලැස්ගමුව බහුකාර්ය ගොඩනැගිල්ල (අදියර III) | මහරගම | 192.00 | | | | 90.00 | ක්‍රියාත්මකව පවතී |
| 18 | වරකාපොල බස් නැවතුම්පොළ (අදියර II) | කෑගල්ල | 65.00 | 40.00 | 5.90 | | 50.00 | ක්‍රියාත්මකව පවතී |

| | ව්‍යාපෘතියේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තාවකාලික ඇස්තමේන්තු ගත කළ අගය (සංශෝධිත) රු. මිලියන | තාවකාලික ඇස්තමේන්තු ගත කළ අගය (සංශෝධිත) රු. මිලියන | වියදම රු. මිලියන | ගෙවීමට ඇති බිල්පත් වටිනාකම රු. මිලියන | අරමුදල් අවශ්‍යතා රු. මිලියන | **2023.12.31** දිනට තත්ත්වය රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|
| 19 | අලව්ව මහජන පොළ සංවර්ධනය (අදියර II) | අලව්ව | 32.00 | | | | 32.00 | ක්‍රියාත්මකව පවතී |
| 20 | සිහිලල් මග මාවත සංවර්ධන ව්‍යාපෘතිය (අදියර II) | අනුරාධපුර | 58.40 | | | | 50.00 | තාවකාලිකව නවතා දමා ඇත |
| 21 | අලව්වේ යෝජිත වාහන නැවැත්වීමේ සහ පදික පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | අලව්ව | 116.50 | | 18.31 | | 98.00 | භාර දීමට නියමිතව පවතී |
| 22 | යෝජිත හොරණ පොළ (IV අදියර) ශේෂ වැඩ සැලසුම් කිරීම සහ ඉදිකිරීම | හොරණ | 20.00 | | | | 20.00 | ක්‍රියාත්මකව පවතී |
| 23 | මිල්ලව නිවාස ඒකක 55ක් ඉදිකිරීම (අදියර I-25 නිවාස ඒකක) | මිල්ලව | 85.81 | 130.00 | 69.03 | 17.19 | 43.78 | වැඩ නිම කර ඇත. UDA විසින් පවරා ගෙන ඇත |
| | | | 14949.45 | 7329.56 | 3842.54 | 227.15 | 9953.84 | |

## 2.2 මූල්‍යමය නොවන හේතූන් මත අතහැර දැමූ ව්‍යාපෘති

ප්‍රධාන වශයෙන් මූල්‍යමය නොවන හේතූන් මත අතහැර දැමූ ව්‍යාපෘති නවයක් මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය යටතේ අවසන් කිරීමට නියමිතව පවතින අතර, එහි වැඩිදුර විස්තර පහත වගුව මගින් පෙන්වා දිය හැකිය.

| අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කාරක සභාව සාකච්ඡා කරන අවස්ථාවේදී ව්‍යාපෘතිය නිම කර තිබූ ප්‍රමාණය | නව තත්ත්වය |
|---|---|---|---|---|
| 1 | කොට්ටාව සිට මාහේනවත්ත දක්වා නව ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම, (මීටර් 1060) වලව්වත්ත | හෝමාගම | 98% | 98% පමණ නිමකර ඇති බවත්, ඉඩම් අහිමිවන පුද්ගලයින් සඳහා වෙනත් තැනක් යෝජනා කර ඇති බැවින් ඉඩම් පවරා ගැනීම සම්බන්ධයෙන් පවතින ගැටළුව |

| | | | | |
|---|---|---|---|---|
| | අසල හයිලෙවල් පාරේ සිට කටුවන අසල දියගම පාර දක්වා (1060m දක්වා) | | | බොහෝ දුරට විසඳා ගෙන ඇති බවත්, හෝමාගම ප්‍රාදේශීය ලේකම් සමඟ දැනට ඇති ඉතිරි ගැටළු ද විසඳා ගැනීමෙන් පසු ව්‍යාපෘතිය නිම කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට ලබාදිය හැකි බව |
| 2 | බේරුවානවත්තේ අඩු ආදායම්ලාභී නිවාස ඉදිකිරීම | ඇහැලියගොඩ | 90% | **ජලය ලබාදීම**<br>බේරුවනාවත්ත නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නිවාස ඒකක සඳහා ජලය ලබා දීමට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වෙත නාගරික සංවර්ධන අධිකාරිය විසින් අදාල ඇස්තමේන්තුගත මුදල වන රු.මිලියන 5.0ක ප්‍රතිපාදන ලබා දී ඇත.ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් ජල සම්බන්ධතාවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br><br>**විදුලිබල සැපයුම**<br>නිවාස ව්‍යාපෘති භූමිය සඳහා විදුලිය ලබාගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර, නිවාස ඒකක සඳහා අදාල විදුලි බලය ලබා ගැනීමට අයදුම්පත් යොමු කරන ලෙසට එම නිවාසලාභීන් දැනුවත් කර ඇත. |
| 3 | ඇහැලියගොඩ පැරණි දුම්රිය මාර්ගය ඔස්සේ සංවර්ධනය කරන විකල්ප මාර්ගය ඉදිකිරීම | ඇහැලියගොඩ | 80% | විකල්ප මාර්ගය සංවර්ධනය සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබාදෙන ලෙස 2024/02/02 දිනැති ලිපිය මඟින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. එසේ වුවද, මේ දක්වා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිචාරයක් දක්වා නොමැත. ඉහත නිර්දේශයන් ලැබීමෙන් පසු වුවද, මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ විකල්ප මාර්ග සංවර්ධනය කිරීම සඳහා එම මාර්ගය තුළ පවතින නිවාස ඒකකවල පදිංචිකරුවන් බේරුවනාවත්ත නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක වෙත ප්‍රතිස්ථාපනය කළ යුතුව ඇත. |
| 4 | ඉමදුව නගර මධ්‍ය සංවර්ධනය | ඉමදුව | 80% | ඉමදුව ව්‍යාපෘතියේ මාර්ග සංවර්ධන කටයුතු හා ප්‍රජා ජල සම්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමේ හැකියාව පවතින බව 2024/04/04 දින පැවති ඉමදුව |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී යෝජනා විය. ඒ අනුව, ඉහත ප්‍රතිපාදන ලැබීමෙන් අනතුරුව මාර්ගගත සංවර්ධන කටයුතු නිම කළ පසු සියලුම ප්‍රතිස්ථාපන වෙළඳසැල්, ව්‍යාපෘති භූමියට විතැන්වීමත් පානීය ජල පහසුකම් ලැබීමෙන් පසු ව්‍යාපෘතියේ පවත්නා ගැටළු නිරාකරණය වීම සිදුවනු ඇත. |
| 5 | සියත තෙත්බිම් උද්‍යානය සංවර්ධනය | ගම්පහ | 60% | ජල රැඳවුම් පොකුණට අවම බාධාවකින් අතුරු මාර්ගය වෙනස් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය එකඟ වූ අතර පොකුණෙහි උද්‍යානය සහ හානියට පත් ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාවේ අධීක්ෂණය යටතේ මාර්ග සංවර්ධන අධිකාරියේ අරමුදල් මගින් ප්‍රතිසංස්කරණය කර අවසන් කිරීමට කටයුතු කිරීම අධිවේගී මාර්ග පුළුල් කිරීම සම්බන්ධයෙන් පවතින ව්‍යාපෘතිය මං තීරු හතරක මාර්ගයක් බවට සංවර්ධනය විය යුතු යැයි ආංශික අධීක්ෂණ කාරක සභාව යෝජනා කළ ද මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය යටතේ මෙය සිදු කළ නොහැකි බවට මාර්ග සංවර්ධන අධිකාරිය දන්වා ඇත. |
| 6 | මාකෙවිට, නෙලුම්විල ඇවිදින මංතීරු ඉදිකිරීම (jogging track) (අදියර I) | ගම්පහ | 25% | • සිදු කිරීමට නියමිත ගෙවීම් (අදියර III)සඳහා නිසි කැබිනට් අනුමැතිය ප්‍රකාශ කරන තෙක් තවමත් නතර කර ඇත.<br><br>• රුක්රෝපණ, ආලෝකය, වාහන නැවැත්වීමේ සහ වැසිකිලි පහසුකම් සහිත ආපන ශාලාව, ළමා ක්‍රීඩා කරන ස්ථානය සහ එළිමහන් ව්‍යායාම ශාලාව ඇතුළු වැඩ වල සමතුලිත විෂය පථය සඳහා සැලසුම් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. |
| 7 | හැටන් දුම්රිය ස්ථානයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | අඹගමුව කෝරළය | ලබා දී ඇති කොන්ත්‍රාත්තු වලින් 100% ක් අවසන් ය. සමස්ත ව්‍යාපෘතියෙන් | නාගරික සංවර්ධන අධිකාරිය සහ දුම්රිය දෙපාර්තමේන්තුව අතර විකල්ප දෙකක් සහිත සංශෝධිත අවබෝධතා ගිවිසුමේ කෙටුම්පත (i. සහාධිපත්‍ය සැලැස්මක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය |

| | | | | |
|---|---|---|---|---|
| | | | 60%ක් අවසන් ව ඇත. | විසින් පෙර විකිණීම; ii. දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ලාභ බෙදාගැනීමේ පදනම මත පෙර විකිණීම)<br>නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2023.08.03 දින ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අතර අවබෝධතා ගිවිසුම අත්සන් කර ඉතිරි වැඩ කටයුතු කරගෙන යාමට ගොඩනැඟිලි දුම්රිය දෙපාර්තමේන්තුවට ලබා දෙන බව |
| 8 | අලව්ව නගරයේ භූමි අලංකරණ සහ නගර අලංකරණ ව්‍යාපෘතිය | අලව්ව | 17% | 2023/07/14 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමට අනුව, ලංකා විදුලිබල මණ්ඩලය, ටෙලිකොම්, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ අලව්ව ප්‍රාදේශීය සභාව සමඟ වත්මන් තත්ත්වය සහ එක් එක් පාර්ශවකරුවන්ගේ වැඩ කටයුතු කරගෙන යාමට බලපාන ගැටළු සාකච්ඡා කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග දැනටමත් ක්‍රියාත්මකව පවතී.<br><br>ලංකා විදුලි බල මණ්ඩලය විසින් සකස් කරන ලද ඉතිරි අරමුදල් අවශ්‍යතාවය (විදුලි කණු මාරු කිරීම සඳහා) සඳහා ප්‍රමාණ බිල්පත (BOQ) ගෙවීම් සිදු කිරීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. විදුලිබල මණ්ඩලය විසින් ට්‍රාන්ස්ෆෝමර් මාරු කිරීම (අංක 03) නිම කරන ලදී<br><br>05/ 08/ 2023 අලව්ව ප්‍රධාන වීදියේ වම් පසින් ජල මාර්ග මාරු කිරීම සහ සම්බන්ධතා සැපයීම 100% ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් නිම කරන ලදී.<br><br>දකුණු පස ජල මාර්ග මාරු කිරීම සඳහා ඉතිරි අරමුදල් අවශ්‍යතාවය සඳහා ප්‍රමාණ බිල්පත (BOQ) ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සකස් කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | නාගරික සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු මාර්ගය කාපට් කිරීම කඩිනමින් නිම කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා සිටින ලදී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලැබී ඇත. |
| 9 | වැලිකඩ බන්ධනාගාරය වෙනත් ස්ථානයකට ගෙන යාම | හොරණ | 0.05% | රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙත බන්ධනාගාර කොමසාරිස් ජනරාල් දන්වා ඇති පරිදි අදාළ ඉඩම්වල තක්සේරු කටයුතු කඩිනම් කරන ලෙස කාරක සභාව ද මැදිහත් වී ලිපියකින් දැනුම් දී ඇත. හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව මඟින් කැබැලි 31ක පැමිණිලි අනුමත කළ පසු ඉඩම් හිමියන්ට වන්දි ලබා දීමට කටයුතු කරන බව. |

**3. තක්සේරු දෙපාර්තමේන්තුව හා නාගරික සංවර්ධන අධිකාරිය අතර තක්සේරු වාර්තා ලබා ගැනීමේදී අපේක්ෂිත වටිනාකම හා තක්සේරු කිරීමට ගතවන කාලය අවම කිරීම හා අපේක්ෂිත අයුරින් නිවැරදි වටිනාකම ලබා ගැනීමට ගත හැකි පියවර**

ඉහත කරුණු මුල් කරගෙන 2023.08.08 දින රැස් වූ පරිසර, ස්වභාවික සම්පත් සහ තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීමේදී පහත යෝජනාවලිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලදී.

**01. තක්සේරු දෙපාර්තමේන්තුව හා නාගරික සංවර්ධන අධිකාරිය අතර තක්සේරු වාර්තා ලබා ගැනීමේදී සම්බන්ධීකරණ කටයුතු ක්‍රමවත් කිරීම.**

<u>සාකච්ඡා කළ කරුණු</u>

තක්සේරු වාර්තා ලබාදීම ප්‍රමාද වීම හා වාර්තා සකස් කිරීමේදී අවශ්‍ය ලිපි ලේඛන වරින් වර කැඳවීම.

<u>තීරණය</u>

i. නාගරික සංවර්ධන අධිකාරිය විසින් තක්සේරු වාර්තාවක් ඉල්ලා ඉල්ලුම් ලිපියක් තක්සේරු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු වෙත විද්‍යුත් තැපැල් පණිවිඩයක් සමඟ අමුණා යොමු කිරීම.

ii. එම තක්සේරු වාර්තාවට අදාළ ඉඩම පිහිටි තක්සේරු දෙපාර්තමේන්තුවේ උප කාර්යාලයට අදාළ තක්සේරු නිලධාරීන් සමඟ තක්සේරු ඉල්ලීම ලැබී එළඹෙන ප්‍රථම සිකුරාදා දින පෙ.ව. 10.00ට නාගරික සංවර්ධන අධිකාරියේ අදාළ නිලධාරීන් සමඟ මූලික සාකච්ඡාවක් සිදු කිරීම. ඒ අනුව එකී තක්සේරුව සඳහා අවශ්‍ය වන

සියලු තොරතුරු, ලේඛණ, නිෂ්කාශන සහතික යනාදිය පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් දැනුවත් කිරීම.

iii. එම අදාළ අතිරේක තොරතුරු දින 14ක් ඇතුළත තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලබා දීම.

**02. තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු හිඟ තක්සේරු ගාස්තු පියවීම.**

<u>සාකච්ඡා කළ කරුණු</u>

නාගරික සංවර්ධන අධිකාරිය විසින් වරින්වර ලබා ගන්නා ලද තක්සේරු වාර්තා සඳහා රු. මිලියන 114.27ක හිඟ මුදලක් ගෙවීමට ඇති බව තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කමිටුව වෙත දැනුම් දෙන ලදී. මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින් සඳහන් කර සිටියේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් දිවයින පුරා පිහිටි ඉඩම් 42න් ආයෝජන කටයුතු සඳහා ආයෝජකයින් වෙත බදු පදනම මත බැහැර කිරීම සඳහා කඩිනමින් පියවර ගන්නා ලෙස 2021.08.06 දින ගරු මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් එම අමාත්‍යාංශයේදී අදාළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවති සාකච්ඡාවේදී තීරණය කරන ලද බවයි. එහිදී එම ඉඩම් සඳහා තක්සේරු වාර්තා නොමැති බැවින් අදාළ ආයෝජකයන් වෙත ඉඩම් සම්බන්ධව අවශ්‍ය තොරතුරු ලබා දීම අප්‍රමාදව සිදු කළ යුතු බැවින් මූලිකව රු. 100,000/-ක මුදලක් එක් ඉඩමක් සඳහා ගාස්තු වශයෙන් ගෙවීමට තීරණය විය. තක්සේරු ගාස්තුවේ ඉතිරි මුදල ආයෝජකයා විසින් බදු වටිනාකමින් 25%ක් නාගරික සංවර්ධන අධිකාරියේ තැන්පත් කළ පසු ගෙවීමත්, මෙම ගාස්තු ගෙවීම් වසර අවසානයට වඩා ප්‍රමාද වන්නේ නම් දෙපාර්ශවය අතර එකඟතාවයකට පැමිණ ක්‍රියා කිරීමට ද අනුව තීරණය විය.

<u>තීරණය</u>

මේ සම්බන්ධයෙන් ඉඩම් 42න්, ගාස්තු ගෙවීම හිඟව ඇති ඉඩම් 14න් ඉඩම් 07ක් සඳහා වූ රු. මිලියන 26.8ක මුදලක් ගෙවීමට නාගරික සංවර්ධන අධිකාරිය එකඟ වූ අතර ඉතිරි මුදල ගෙවීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡාවකට එළඹ තීරණය කිරීම සුදුසු බව කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**03. දේපල හා ඉඩම් තක්සේරු කිරීමේදී ලබා දෙන තක්සේරු වටිනාකම් විවෘත වෙළඳපොල මිල ගණන් හා සමපාත නොවන බැවින් නාගරික සංවර්ධන අධිකාරියේ දේපල සඳහා ආයෝජනය කිරීමට ආයෝජකයන් ඉදිරිපත් නොවීම.**

<u>සාකච්ඡා කළ කරුණු</u>

නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් කරුණු දක්වමින් පවසා සිටියේ පසුගිය වසර 03ක කාලය තුලදී කැඳවනු ලැබූ යෝජනා 36ක් අතුරින් ආයෝජකයන් ඉදිරිපත් වී ඇත්තේ ඉඩම් 10කට පමණක් බවය. මේ සම්බන්ධයෙන් බොහෝ ආයෝජකයින් ප්‍රකාශ කර ඇත්තේ බදු වටිනාකම ඉතා අධික බවත් ඒ වෙනුවට ඒ හා සමාන මුදලකට එම ප්‍රදේශයෙන් සින්නක්කර අයිතියට ඉඩම් ලබා ගත හැකි බවත්ය.

<u>තීරණය</u>

i. තක්සේරු වාර්තාව ලබා දීමේදී ඉඩම පිහිටි ප්‍රදේශය ආශ්‍රිතව පුළුල් අධ්‍යනයක් කර තක්සේරු වාර්තා ලබා දීමටත්, ඒ සඳහා අවශ්‍ය වන සියලු තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලබා දීමටත් තීරණය විය.

ii. තක්සේරු වාර්තා ලබා දීමේදී තක්සේරු මුදල සාධාරණීකරණය කිරීම පිණිස අනුගමනය කරන ලද තක්සේරු ක්‍රමවේදය හා ගණනය කිරීම් පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් අදාළ තක්සේරු වාර්තාව සමඟ නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දීමට තීරණය විය.

**04.** **තක්සේරු වාර්තා ලබාදීම සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව හා නාගරික සංවර්ධන අධිකාරිය එළඹීමට නියමිත ගිවිසුම සඳහා සංශෝධන**

<u>සාකච්ඡා කළ කරුණු</u>

නාගරික සංවර්ධන අධිකාරිය විසින් තක්සේරු වාර්තා ලබා ගැනීමේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ඒකපාර්ශවීය ගිවිසුම සඳහා ඉදිරිපත් කරන ලද සංශෝධන 05ක් එකී ගිවිසුමට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. එම සංශෝධන 05න් අදහස් කරන ප්‍රධාන අරමුණ වන්නේ තක්සේරු වාර්තා සඳහා අත්තිකාරම් මුදල ගෙවූ දින සිට උපරිම මාස 03ක් ඇතුළත තක්සේරු වාර්තාව ලබා දීමට තක්සේරු දෙපාර්තමේන්තුව එකඟ විය යුතු බවයි.

<u>තීරණය</u>
ඉහත සාකච්ඡා කළ පරිදි නාගරික සංවර්ධන අධිකාරිය යෝජනා කර ඇති සංශෝධන සේවාලාභී ආයතනය සමඟ එළඹීමට අදහස් කරන සේවා ගිවිසුමට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ගන්නා ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.

**05.** **සෘජු විදේශ ආයෝජකයින් සඳහා ඉඩම් බැහැර කිරීමේදී ප්‍රධාන තක්සේරුකරුගේ වටිනාකමින් වට්ටමක් අඩු කර ගෙවිය හැකි පරිදි අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.**

<u>සාකච්ඡා කළ කරුණු</u>

රුපියලේ අගය ඇමරිකානු එක්සත් ජනපද ඩොලරයේ අගයට සාපේක්ෂව කාලීන වශයෙන් සිදුවන අවප්‍රමාණය සැලකිල්ලට ගෙන ඉඩමේ වටිනාකම නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවීමේදී යම් වට්ටම් මුදලක් ආයෝජකයන් වෙත ලබා දීම තුලින් විදේශ ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට හැකි බව සඳහන් විය. එහිදී ඉඩමේ බදු වටිනාකම අපේක්ෂිත සංවර්ධනය, තුලින් දේශීය ආර්ථිකයට ලැබෙන පිටුවහල යනාදී කරුණු සැලකිල්ලට ගෙන පිරිනැමිය යුතු වට්ටම තීරණය කිරීම.

<u>තීරණය</u>

මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනීම.

**06.** **බදු වටිනාකම ගෙවීමේදී එකවර අයකර නොගෙන වාරික වශයෙන් ගෙවීමට ආයෝජකයාට අවස්ථාව ලබා දීම.**

<u>සාකච්ඡා කළ කරුණු</u>

මේ පිළිබඳව දැනට නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින් ප්‍රකාශ කර සිටියේ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පිණිස කළමනාකරණ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇති බවයි. එහිදී ආයෝජකයාගේ අභිමතය පරිදි බදු මුදල ගෙවීම සඳහා විකල්ප අවස්ථා ලබා දීමට පියවර ගනු ලැබේ.

උදා :-
බදු මුදලින් 25% ක් ගෙවීමෙන් අනතුරුව බදු ගිවිසුම අත්සන් කර දේපලේ භුක්තිය ආයෝජකයා වෙත භාර දීමටත්, ඉතිරි 75% ක මුදල වාර්ෂිකව වසර 10 ක් තුල වාර්ෂික බදු කුලිය ලෙස ගෙවා අවසන් කිරීමටත් අවස්ථාව ලබා දීම.

## 04. නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රතිපත්තිය

1. ගරු අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල ආර්ථික, සමාජීය හා භෞතික වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ වූ සැලැසුම් කිරීම හා එසේ සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම හා එයට සම්බන්ධ හෝ අනුෂාංගික කරුණු ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) ස්ථාපිත කර ඇත.

2. ප්‍රකාශිත නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට ඉහත කී නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත බලය පැවරී ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(1),16(1) හා 17(1) දරන වගන්ති යටතේ පළාත් පාලන ආයතන සතු ඉඩම් පවරා ගැනීම හා පෞද්ගලික හිමිකාරීත්වය සහිත ඉඩම් අත්පත් කර ගැනීම හා රජයේ ඉඩම් පවරා ගැනීම තුලින් අපේක්ෂිත සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරනු ඇත.

3. 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ ප්‍රතිපාදන අනුව හඳුනාගෙන ඇති ඉඩම් සඳහා අත්පත් කර ගැනීමේ ක්‍රියාපටිපාටිය ආරම්භ කරනු ඇත.

4. පළාත් පාලන බල ප්‍රාදේශය සඳහා සකස් කරනු ලබන සංවර්ධන සැලසුම් යටතේ හඳුනාගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති හා නාගරික සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් අවස්ථාවලදී ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කරනු ඇත.

i. නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදල් තුලින් ක්‍රියාත්මක කරනු ලබන ශක්‍යතා අධ්‍යයනයක් සහිත ව්‍යාපෘති යෝජනාවකින් පසු ව්‍යාපෘති හඳුනාගනු ලබයි. සුදුසුකම්ලත් පුද්ගලයෙකු විසින් ශක්‍යතා අධ්‍යයනය කළ යුතු අතර, නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම හා අරමුදල් සම්පාදනය තහවුරු විය යුතුය. තවදුරටත් ඉඩම් අත්පත් කර ගැනීමට අරමුදල් සම්පාදනය හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වගකීම නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් දැරිය යුතු වනු ඇත.

ii. භාණ්ඩාගාර අරමුදල් තුලින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික හා කලාපීය මට්ටමේ ව්‍යාපෘති හඳුනාගනු ලබයි. අමාත්‍ය මණ්ඩලය හා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද වහාම මෙම ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. අත්පත් කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳව මහා භාණ්ඩාගාරයේ අයවැය දෙපාර්තමේන්තුවේ තහවුරුවක් ලබාගත යුතු ය.

iii. පළාත් පාලන ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට පෙර පළාත් පාලන ආයතන මගින් සම්පූර්ණ ඇස්තමේන්තුගත වන්දි මුදල නාගරික සංවර්ධන අධිකාරියේ තැන්පත් කළ යුතු ය.

5. නාගරික සංවර්ධන විෂය පථයට පරිබාහිර මාර්ග අධ්‍යාපනික සංවර්ධන වැනි ව්‍යාපෘති සඳහා හඳුනාගෙන ඇති ඉඩම් අත් කර ගැනීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක නොකරන අතර, ඒ වෙනුවට එම කටයුතු අදාළ රේඛීය අමාත්‍යාංශය හරහා සිදු කරගත යුතු ය.

## 05. කාරක සභාවේ නිර්දේශ

1.දැනට ඉදිකිරීම නැවතී ඇති නිවාස ව්‍යාපෘති පෞද්ගලික හෝ රාජ්‍ය බැංකු මගින් ලබාගත් ණය මුදලක් මගින් නිම කර කඩිනමින් ඒවා විකිණීමට කටයුතු කිරීම. මෙහිදී අදාළ ව්‍යාපෘතිය අනුව නිම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

2.විවිධ දේශපාලන නායකත්වයන්ගේ කාලවලදී අසාර්ථක ලෙස ව්‍යාපෘති ආරම්භ කිරීමට සිදුවුවද, පසුව ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය නොලැබීම මත එම ව්‍යාපෘති අතරමග නැවතී ඇත. මෙවන් තත්ත්වයක් මින්පසු සිදු නොවීම පිණිස මෙම ව්‍යාපෘති හා අනාගතයේදී සිදු කිරීමට යෝජිත නව ව්‍යාපෘති පිළිබඳ තීන්දු ගැනීමට නාගරික සංවර්ධන අධිකාරියේ ඉහළ නිලතලවලින් යුතු නිලධාරීන්ගෙන් සමන්විත නෛතික බලයක් හිමි කමිටුවක් පත් කිරීම හා එයට අදාළ තීරණ ලබා ගැනීමට නිර්දේශ කරන ලදී. එසේම මෙම කමිටුව සඳහා ව්‍යවස්ථාදායක සභාව හරහා නියෝජිතයන් පත් කිරීම සිදු කළ යුතුය.

3.දැනට නැවතී ඇති නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති සංශෝධනයකට යටත් කර එම ව්‍යාපෘති ස්වයං මූල්‍ය ප්‍රතිපාදන ලබාගත හැකි ආකාරයට පරිවර්තනය කර ක්‍රියාත්මක කිරීම

4. ජාතික තලයේ ව්‍යාපෘති විවිධ ආයතන අතර අනෝන්‍ය බල හුවමාරුව මත නැවතී ඇති බැවින් ඒවා සම්බන්ධීකරණය කර ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය මැදිහත් වී ක්‍රියාකළ යුතු ය.

5. ඉඩම් අත්පත් කරගෙන භාවිතයට ගැනීමේදී වන ප්‍රමාදයන් වැළැක්වීම සඳහා ක්‍රමවේදයක් සැකසිය යුතුය.

මෙහිදී පහත සඳහන් ආයතනවලින් එක් නියෝජිතයකු බැගින් පත්කර සාදනු ලබන කමිටුවක් ජනාධිපති කාර්යාලයේ නියෝජිතයන්ගේ ප්‍රධානත්වයෙන් මසකට වරක් රැස්වී මෙම කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම

මෙම ආයතන නම්,

ජනාධිපති ලේකම් කාර්යාලය - කැඳවුම්කරු

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

නාගරික සංවර්ධන අධිකාරිය

ඉඩම් අමාත්‍යාංශය

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

6. ඉඩම්වල තක්සේරු වාර්තා ලබා ගැනීමේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා තක්සේරු වාර්තා හා වෙනත් ආකාරවලින් ලබාගන්නා වූ තක්සේරු වාර්තා අතර ඉතා විශාල වටිනාකම්වල වෙනසක් පවතින බැවින් රජයේ තක්සේරු වාර්තා ලබා දීමේදී මේ සඳහා පදනම් කරගන්නා වූ නිර්නායකවලට පදනම් වන කරුණු පැහැදිලිව සඳහන් කළ යුතු අතර එම නිර්ණායක අදාළ වාර්තා ඉල්ලුම් කළ පාර්ශව වෙත ද ලබා දිය යුතුය.

7. පෞද්ගලික ආයෝජකයන් වෙත දේපළ ලබා දීමේදී රජයේ තක්සේරු මිල ගණන් සඳහා ආයෝජකයන් ඉදිරිපත් නොවන අවස්ථාවලදී, එම තක්සේරු වාර්තා තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ එකතු වී නැවත සලකා බැලිය යුතු බව. මීට අමතරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගත් ඉඩම් සඳහා ආයෝජකයන් කැඳවීමේදී (Request for proposals) ඉඩමේ වටිනාකම අදාළ ආයෝජකයා මෙන්ම අදාළ නිර්ණායකවලට අනුකූලව, පිළිගත් තක්සේරුකරුගේ අත්සනින් යුතුව ලබා ගැනීමටත්, ඉන්පසුව එම තෝරාගත් ආයෝජකයා විසින් අධිකාරිය වෙත ලබාදෙන සංවර්ධන යෝජනාව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර, එම යෝජනාව අනුව අදාළ තක්සේරුව දෙපාර්තමේන්තුව මඟින් ලබා ගැනීමටත්, යෝජනා කරන අතර, එහිදී තක්සේරුකරු රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරුව අතර විශාල පරතරයක් ඇත්නම් ඒ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය හා තක්සේරු දෙපාර්තමේන්තුව සාකච්ඡා කර අවශ්‍ය තීරණ ගැනීමට යෝග්‍ය බව යෝජනා කරමි.

## 6. කාරක සභාව වෙත කැඳවන ලද ආයතන සහ නිලධාරීන්

<u>නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය</u>

ඩබ්ලිව්.එස්. සත්‍යානන්ද මහතා, ලේකම්

එස්. ඩී.ඒ.එච්. පියතිලක මහතා, අතිරේක ලේකම්

ඩී.ඩී.මාතරආරච්චි මහතා, අතිරේක ලේකම් (සැලසුම්)

ආචාර්ය එම්.එම්.එස්.එස්.බී.බී. යාලේගම මහතා, අතිරේක ලේකම් (ප්‍රතිපත්ති, ව්‍යාපෘති සහ පාර්ලිමේන්තු කටයුතු)

එන්.ඩී. නාමරත්න මෙනෙවිය, අතිරේක ලේකම් (නාගරික සංවර්ධන)

තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

ඩබ්ලිව්.පී.යූ. කාවින්ද්‍යා මහත්මිය, සහකාර ලේකම් (නාගරික සංවර්ධන)

එම්.කේ. ටියුෂන් මහතා, හිටපු අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් හා මෙහෙයුම්)

කේ.පාක්කිරාසා මහතා, අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් හා මෙහෙයුම්)

ඉංජිනේරු එම්.ඩබ්ලිව්.පී.ද සිල්වා මහතා, අධ්‍යක්ෂ ජනරාල් (නාගරික සංවර්ධන)

එච්.පී. ලලිත් කුමාර මහතා, ප්‍රධාන මූල්‍ය නිලධාරී

එම්.ඒ.පී.අයි.කරුණාසේකර මහතා, අධ්‍යක්ෂ (නාගරික සංවර්ධන)

බී.ඒ.එස්. මල්ලවාරච්චි මහතා, අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්)

ඩී.ඒ. සිරිවීර මහත්මිය, අධ්‍යක්ෂ (ඉඩම්)

ජී.පී.වයි. කුමාරි මහත්මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක

එන්.ජී.ටී. පෙරේරා මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්)

ප්‍රියංගා සේනාරත්න මහත්මිය, අධ්‍යක්ෂ (සැලසුම්)

එම්.කේ.එම්. ප්‍රබෝදිනී මහත්මිය, සහකාර අධ්‍යක්ෂ (නාගරික සැලසුම්)

<u>නාගරික සංවර්ධන අධිකාරිය</u>

ප්‍රසාද් රණවීර මහතා, අධ්‍යක්ෂ ජනරාල්

මහින්ද විතානච්චි මහතා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

එන්.ඒ.එස්.එන්. නිශ්ශංක මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ව්‍යාපෘති)

ආනන්ද සමරසිංහ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන)

එම්.පී. රණතුංග මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)

ආර්.ඒ.සී.ප්‍රියශාන්ත මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (දේපල හා ඉඩම් කළමනාකරණ)

සම්පත් ගුණතිලක මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්)

ඒ.එම්.එන්.එස්. බණ්ඩාරනායක මහතා, අධ්‍යක්ෂ (මුදල්)

අනුර ප්‍රසන්න මහතා, අධ්‍යක්ෂ(දේපල සංවර්ධන)

දයානි ෆ්‍රැන්සිස් මහත්මිය, අධ්‍යක්ෂ (ඉඩම්)

ඒ.ටී.පී. ද අල්විස් මහත්මිය, අධ්‍යක්ෂ(කොළඹ මහ නගර සභා ප්‍රදේශය)

වයි.ඒ.ජී.කේ.ගුණතිලක මහතා, අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)

ජී.එන්. ප්‍රේමවර්ධන මහතා, අධ්‍යක්ෂ (නාගරික සංවර්ධන සහ විශේෂ ව්‍යාපෘති)

චන්දනා කළුපහන මහත්මිය, අධ්‍යක්ෂ (පරිසරය සහ භූ දර්ශන)

ලාවන්‍යා එස්. වීරසූරිය මහත්මිය, අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකාර-දකුණු කලාපය)

බී.එල්.කේ. ඉන්දිකා බාලසූරිය මහත්මිය, අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකාර – උතුරු කලාපය)

තුෂාරි තිලකරත්න මහත්මිය, අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකාර- බස්නාහිර කලාපය)

එච්.එම්. සුගත් ප්‍රේමසිරි මහතා, අධ්‍යක්ෂ (සබරගමු කලාපය)

එච්.එම්.පී.හේමමාලි මැණිකේ මහත්මිය, අතිරේක අධ්‍යක්ෂ (නාගරික සැලසුම්)

ඉමාලි ජයවීර මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාපෘති)

ඩී.කේ.එස්.පී. සඳරුවන් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)

ඒ.ටී. අලුත්පාල මහතා, සහකාර අධ්‍යක්ෂ (මුදල්)

නිමේෂ් චන්ද්‍රතිලක මහතා, බලාත්මක නිලධාරී

<u>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය</u>

ජේ.එස්.එස්. රූපසිංහ මහත්මිය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව

අසන්ත ගුණසේකර මහතා, අධ්‍යක්ෂ, වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ජේ.එම්. හේරත් බණ්ඩාර මහතා, අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

එස්.ඒ. ආර්. තරංග මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව

<u>සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය</u>

කෝකිලා හේමචන්ද්‍ර මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉඩම් අත්පත් කර ගැනීම)

අශානි එස්.සෙනෙවිරත්න මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉඩම් අත්පත් කර ගැනීම)

පුබුදිකා එස්. බණ්ඩාර මහත්මිය, අධ්‍යක්ෂ(ඉඩම් අත්පත් කර ගැනීම)

<u>වාරිමාර්ග දෙපාර්තමේන්තුව</u>

ඉංජිනේරු පී.එල්.එන්.පුරාණෙගෙදර මහතා, වාරිමාර්ග අධ්‍යක්ෂ (කොළඹ)

ඉංජිනේරු එම්.ඒ. ජයකොඩි මහත්මිය, වාරිමාර්ග අධ්‍යක්ෂ(භෞතික සම්පත් කළමනාකරණ)

ඉංජිනේරු එස්.ආර් වීරරත්න මහතා, ප්‍රධාන ඉංජිනේරු(පාරිසරික අධ්‍යයන)

<u>රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව</u>

ඩබ්ලිව්.ක්‍රිස්ටීන් ඊ පෙරේරා මහත්මිය, නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු

ඒ.වී.යූ. වසන්ත මහතා, ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු

ආර්.පී.ආර්.අයි.මයුරවංශ මහතා, ජොෂ්ඨ තක්සේරුකරු

ඒ.කේ.මාරසිංහ මහතා, තක්සේරුකරු

එල්.එස්. උපේක්ෂිකා මහත්මිය, සංවර්ධන නිලධාරී

<u>බන්ධනාගාර මූලස්ථානය</u>

එච්.එම්.ටී.එන් උපුල්දෙණිය මහතා, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

කේ.පී.ප්‍රසාද් ඉන්දික මහතා, අධ්‍යක්ෂ (ඉංජිනේරු)

එන්.සුරංජි විජේවර්ධන මහත්මිය, අධ්‍යක්ෂ (සැලසුම්)

ජේ.එම්.එස්.යූ.බී. ජයසේකර මහතා, අධ්‍යක්ෂ (ඉංජිනේරු)

බී.ඩබ්.එම්.ජී.බී දිසානායක මහතා, බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්)

<u>ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව</u>

වී.එස්.පොල්වත්තගේ මහතා, අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

ඩී.ඩබ්ලිව්.එන්. අමරසේන මහතා, නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු (ගොඩනැගිලි)

පී.ජී. ප්‍රේමතිලක මහතා, නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු (සැලසුම් හා ව්‍යාපෘති)

ආනන්ද කරුණාරත්න මහතා, නියෝජ්‍ය වාණිජ නිලධාරී (ඉඩම්)

කේ.කේ. හේවාවිතාන මහතා, ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු

<u>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය</u>

කේ.ජී.එන්.එස් කුමාර මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

එම්.වයි.එම්.ආසිරි මහතා, සහකාර සාමාන්‍යාධිකාරී

ජී.ඩබ්.දේශප්‍රිය මහතා, සහකාර සාමාන්‍යාධිකාරී

<u>මාර්ග සංවර්ධන අධිකාරිය</u>

එල්.වී.එස් වීරකෝන් මහතා, අධ්‍යක්ෂ ජනරාල්

ආචාර්ය එස්.ජේ.විදානපතිරණගේ මහතා, අධ්‍යක්ෂ (අධිවේගී මාර්ග සැලසුම්)

එස්.ඒ.එස්.ටී. සාලවවිදාන මහතා, අධ්‍යක්ෂ (අධිවේගී මාර්ග නිර්මාණ)

ඩී.ආර්.එම්.ඩබ්ලිව්. ආර්. ඇහැලියගොඩ මහතා, පළාත් අධ්‍යක්ෂ (සබරගමුව)

ආර්.එම්.ජේ.එන්.රත්නායක මහතා, ව්‍යාපෘති අධ්‍යක්ෂ,CEP 1

එස්.එම්.එස්.එස්.සේනානායක මහත්මිය, ජොෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු,CEP 1

ඒ.එම්.ඒ. වරුණජිත් මහතා, ව්‍යාපෘති ඉංජිනේරු,CEP 1

ඩී. සුදර්සන් මහතා, ව්‍යාපෘති අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)

කේ.කේ. බන්දුල මහත්මිය, ප්‍රධාන ඉංජිනේරු (ගාල්ල)

ඒ.එම්.ඒ.වරුනජිත් මහතා, ව්‍යාපෘති ඉංජිනේරු

ඩී.ටී.එම්.අයි.දිසානායක මහත්මිය, ඉංජිනේරු

<u>**ලංකා විදුලිබල මණ්ඩලය**</u>

ඉංජිනේරු යූ.ජී.ජේ.කේ.ගම්ලත් මහත්මිය, ප්‍රධාන ඉංජිනේරු (සැලසුම් සහ සංවර්ධන)

<u>**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගම්පහ**</u>

සුරංග ලක්ෂිනි ගුණතිලක මහත්මිය, ප්‍රාදේශීය ලේකම්

චමරි ඉනෝකා රණවීර මෙනවිය, විමර්ශන නිලධාරිනී

<u>**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇහැලියගොඩ**</u>

එච්.සී.එන් ධර්මපාල මහතා, ප්‍රාදේශීය ලේකම්

<u>**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හොරණ**</u>

කේ.ඩී.එස් සජීවනා මහත්මිය, ප්‍රාදේශීය ලේකම්

<u>**මහ නගර සභාව - ගම්පහ**</u>

ජේ.ඒ.ඩී.ජී.එස්. රණසිංහ මහත්මිය, නාගරික කොමසාරිස්

<u>**සියත ව්‍යාපෘතිය - ගම්පහ**</u>

එස්.එම්.ජේ.යූ සමරකෝන් මහතා

එන්.ඩී.බී.වයි.නානායක්කාර මහතා

ඩී.එම්.ජී.දසනායක මහතා

ඒ.ඒ.ඩී.ආර්.පී. ආරියප්පෙරුම මහතා

ඩබ්ලිව්.ඒ.පී.ෂර්මලී පෙරේරා මහත්මිය